**ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 30 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල හා කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

-------

## 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 2,182.85 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 2,135.02 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 47.83 ක් හෙවත් සියයට 2.19 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,351.05 | 1,304.16 | 46.89 | 3.47 |
| මූලධන | 831.80 | 830.86 | 0.94 | 0.11 |
| **එකතුව** | **2,182.85** | **2,135.02** | **47.83** | **2.19** |

**2.2** **ආදායම් ගිණුම්**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත දෙකක් සඳහා එකතුව රු.මිලියන 1,590.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 2,287.50 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 143.987ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉක්මවීම ඇස්තමේන්තුවේ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10:03:07:03 | 90.00 | 115.68 | 25.68 | 28.53 |
| 20:02:01:02 | 1,500.00 | 2,171.82 | 671.82 | 44.79 |
| **එකතුව** | **1,590.00** | **2,287.50** | **697.50** | **43.87** |

**2.3** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 69.00 | 68.04 | 50.00 | 67.87 | 281.00 | 213.56 |

**2.4** **අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0045/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 119.85 ක් විය.

**2.5** **පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 07 ක 2016 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂවල එකතුව රු. මිලියන 500.92 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු. මිලියන |
| 6000/0000/00/0001/0020/000 | 311.67 |
| 6000/0000/00/0006/0021/000 | 149,93 |
| 6000/0000/00/0013/0069/000 | 39.04 |
| 6000/0000/00/0002/0103/000 | 0.15 |
| 6000/0000/00/0019/0028/000 | 0.07 |
| 6000/0000/00/0016/0051/000 | 0.04 |
| 6000/0000/00/0018/0064/000 | 0.02 |
| **එකතුව** | **500.92** |

**2.6 විගණන නිරීක්ෂණය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
| --- | --- | --- |
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 06 ක සිට සියයට 15 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.9,995,216 ක් වූ තැන්පතු 99 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 ආදායම් ගිණුම්**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) 20:02:01:02 දරන ආදායම් සංකේතය - රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. මිලියන 538.70 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

(ii) රාජ්‍ය දැව සංස්ථාවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ස්කන්ධභාග මුදල් සහ රාජ්‍ය දැව සංස්ථාවෙන් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ස්කන්ධභාග මුදල් අතර රු. 160,252,319 ක වෙනසක් පැවැතුණි.

**(ආ) 10:03:07:03 දරන ආදායම් සංකේතය - පුද්ගලික දැව ප්‍රවාහනය**

විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. 935,240 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම වර්ෂ 01 ක සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි. එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 28301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු.10,758,777 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2015 නොවැම්බර් 27 දින පිළියෙල කර තිබුණි.

### 3.6.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රු.මිලියන 2,046.34 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම මුදල් වර්ෂය අවසාන වන විට එනම් 2015 දෙසැම්බර් 18 දින පිළියෙල කර තිබුණි.

### 3.7 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2017 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2015 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

### 3.8 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (අ) මුදල් රෙගුලාසි 104(1) | පාඩුවක් හෝ අලාභයක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැනගැනීමටත් එයට වගකිවයුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතුය. දෙපාර්තමේන්තුවේ සිදු වී තිබුණු හානිවීම් 09 ක් සම්බන්ධයෙන් වාර්තා කිරීමට දීර්ඝ ප්‍රමාදයන් සිදු කර තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 104(3) | නැතිවීම්/පාඩුවීම් සම්බන්ධ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට ප්‍රාරම්භක වාර්තාවක් වහාම යැවිය යුතුව ඇතත් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීම මාස 01 සිට වසර 06 දක්වා දීර්ඝ ප්‍රමාදයන් සිදු කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | මුදල් රෙගුලාසි 104(4) | අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන් මාසයක් ඇතුළත පූර්ණ වාර්තාවක් පිළියෙල කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ සිදු වී තිබුණු අලාභහානි සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට මාස 01 ක සිට වර්ෂ 06 ක් දක්වා දීර්ඝ ප්‍රමාදයක් සිදු කර තිබුණි. |

**3.9 කාර්යසාධනය**

-----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) නොමේරූ පැළ වගාවන් නඩත්තු කිරීමේ කාර්යය සඳහා රු. මිලියන 80 ක ප්‍රතිපාදන සලසා ගෙන හෙක්ටයාර් 4,060 ක වැඩ කටයුතු අවසන් කිරීමට සැලැසුම් කර තිබුණි. කාර්යසාධන වාර්තාවට අනුව ඉටු කළ ප්‍රමාණය හෙක්ටයාර් 2,180.2 ක් වී තිබුණි.

(ii) ෆයිනස් වන වගා පුළුල් පරාසයක පරිවර්තනය කිරීම හා නඩත්තු කිරීම සඳහා සලසා තිබූ ප්‍රතිපාදනය රු මිලියන 20 ක් වූ අතර එමඟින් හෙක්ටයාර් 495 ක කටයුතු සිදු කිරීමට නියමිතව තිබුණද, හෙක්ටයාර් 194.6 ක පමණක් කටයුතු සිදු කර තිබුණි.

(iii) ශ්‍රී ලංකා මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම සඳහා රු. මිලියන 26 ක ප්‍රතිපාදන මඟින් හෙක්ටයාර් 681 ක නඩත්තු කටයුතු සිදු කළ යුතු වුවද, කාර්යසාධන වාර්තාවට අනුව හෙක්ටයාර් 361.8 ක පමණක් නඩත්තු කටයුතු සිදු කර තිබුණි.

**3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-------------------------------------

**ගැලපුම් කළ යුතු ශේෂ**

------------------------

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු ගිණුම්17 කට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොකළ එකතුව රු.294,993 ක් වූ චෙක්පත් 97 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි..

**3.11 පාඩු හා හානි**

----------------

සිද්ධීන් 87 කට අදාළ එකතුව රු.11,905,543 ක අලාභහානි අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ 2017 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.12 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) පුද්ගලික සමාගමක් විසින් මුලතිව් දිසාවේ ඔලුමඩු අඩවියෙහි වමලන්කුලම රජයේ කැළයෙහි කළුගල් කඩා ඉවත් කිරීම සිදු කර තිබුණි. 2014 හා 2015 යන වර්ෂයන්හි එම සමාගම විසින් වැඩිපුර කඩා ඉවත් කර තිබූ කළුගල් කියුබ් 1,374 ක් සඳහා රු.1,513,445 ක් දෙපාර්තමේන්තුව විසින් අය කර ගෙන නොතිබුණි.

(ii) හම්බන්තොට දිසාවේ මල් අස්නාගල රක්ෂිතයෙහි මහ අලුත්ගම්ආර ප්‍රදේශයෙහි සමාගමක් විසින් පවත්වා ගෙන ගිය කළුගල් වැඩපළවල් දෙකෙහි, අනුමත බලපත්‍ර සීමාව ඉක්මවා ඒබීසී කියුබ් 600 ක් කඩා ඉවත් කර තිබුණි.

(iii) හම්බන්තොට දිසාවේ, සදර්න් සමූහ ව්‍යාපාරය විසින් 2008 පෙබරවාරි මාසයේ සිට මැයි මාසය දක්වා කාලය තුළ වැඩිපුර කඩා ඉවත් කර තිබූ කළුගල් කියුබ් 2,462.14 ක් සඳහා වූ රු. 246,214 ක ගාස්තු හා 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පරිහරණය කරන ලද භූමි ප්‍රමාණය හා භූමි පුනරුත්තාපනය කිරීම සඳහා (පර්චස් 1,205.36) නියමිත හිඟ ගාස්තු රු.11,026,608 ක් කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගෙන නොතිබුණි.

(iv) 2014 සැප්තැම්බර් 04 දින දෙපාර්තමේන්තුවේ වාහනයකට සිදු වූ ක අලාභහානිය රු.474,300 ක් ලෙස තක්සේරු කර තිබුණි. එම අනතුර සිදු වී වර්ෂ 2 මාස 09 ක් ගත වී තිබුණ ද, අදාළ වගකිව යුතු පාර්ශවයන් ගෙන් අදාළ අලාභය අය කර ගෙන නොතිබුණි.

(v) පන්නිපිටිය පැළ තවාන් භූමියේ ගර්හිත වාහන 13 ක්ද, දිසා වන කාර්යාල 07 කට අදාළව වාහන 20 ක්ද, නුවරඑළිය වන විද්‍යායතනයේ වාහන 03 ක්ද වශයෙන් වාහන 36 ක් ගර්හිත තත්ත්වයේ පැවති අතර, 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කර නොතිබුණි.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 65 | 20 |
| (ii) | තෘතියික මට්ටම | 42 | 30 | 12 |
| (iii) | ද්විතියික මට්ටම | 1,385 | 1,070 | 315 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,634 | 1,453 | 181 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 05 | - | 05 |
| | **එකතුව** | **3,151** | **2,618** | **533** |